# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබා දීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදනමධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

DOA

තාක්ෂණික පත්‍රිකා අංක 02- 2017 පෙබරවාරි


## හදිසි වියළි කාළගුණ තත්වයට මුහුණ දීම වෙනුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉදිරි වැඩපිළිවෙල

ඔක්තෝම්බර් හා නොවැම්බර් මාස වල ලැබිය යුතු දෙවන අන්තර් මෝසම් වැසි හා ඊසානදිග මෝසම් වැසි මෙම වසරේ දිවයිනේ කෘෂිකාර්මික වශයෙන් වැදගත් සියළුම ප්‍රදේශ වලට ලැබී ඇත්තේ 50% වඩා අඩු මට්ටමක බැවින් දැනට ජලාශ වල ජලය පවතිනුයේ සාමාන්‍ය මහ කන්නයක දී පවතින ජල මට්ටමින් 30% කි. මෙය පැහැදිලිවම නියං තත්වයක් වන අතර මෙම නියං කාල සීමාව තුල මදවැසි ඇති වන නමුත් මෙවැනි වැසි මගින් ජලාශ වල ධාරිතාවය ප්‍රමාණාත්මක වෙනසක් නොවේ. දැනට ජලාශ වල ඇති මෙම ජල ප්‍රමාණය මහ කන්නයේ දී වගා කළ බිම් සඳහා ප්‍රමාණවත් නොවන නිසාම ඉදිරි යල කන්නයේ (2017 යල) වී වගාවන් එම ජල ආශ්‍රිතව ආරම්භ කිරීමට නොහැකි වනු ඇත. මෙය 1974න් පසුව පැමිණි බරපතලම නියගය විය හැක. මෙම වියළි කාලගුණ තත්වය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කල්තියාම මැනවින් හඳුනාගත් අතර ඊට මුහුණ දීමට විවිධ සැලසුම් හා නිර්දේශ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කර තිබේ.

### වී වගාව

- යල් කන්නය ආරම්භයේදී පළමු වැස්සත් සමගම කෙටි කාලයක් තුළ බිම් සැකසීම සිදු කරන්න. (හැල් සහ අර්ධ හැල් කුඹුරු සඳහා ශූන්‍ය හෝ අවම බිම් සැකසීම කළහැක). ලැබෙන වර්ෂා ජලය උපරිම ලෙස වගාවට යොදා ගැනීමට ලියදි වල ජලය රඳවා තබා ගැනීම සඳහා නියරෙහි ජලය අපතේ යන සියලුම තැන් පිළිසකර කර නියර බැඳ හොඳින් මඩ තබා ගැනීම ද අත්‍යවශ්‍යයි.
- ප්‍රමාණවත් තරම් ජලය නොමැති නම් කැකුලන් ක්‍රමයට බීජ වපුරන්න.
- පැරශූට් ක්‍රමය යොදා ගැනීමේ දී අක්කරයක් සඳහා බීජ වී අවශ්‍ය වන්නේ කි.ග්‍රෑ 8 - 12 ක් පමණ ප්‍රමාණයකි. එය බීජ වී හිඟයට පිළියමක් මෙන්ම ජල මුර 1-2 ක් ඉතිරි කර ගැනීමට ද උපකාර වේ.
- නියඟය සඳහා ඔරොත්තු දෙන හා නියඟය මඟ හැරවීමේ හැකියාව යන ලක්ෂණ සහිත වී ප්‍රභේද වගා කිරීමට මාස 2 1/2 වයස් කාණ්ඩයේ වී ප්‍රභේද වන Bg 250, Bg 251, Bg 252, Ld 253 සහ මාස 3 වයස් කාණ්ඩයේ වී ප්‍රභේද ලෙස Bg 300, Bg 304, Bg 310, At 306, At 311 වගා කිරීම සුදුසු වේ.
- වියළි තත්ත්ව යටතේ ලවණතාවය වැඩිවිය හැකි ප්‍රදේශ සඳහා ලවණතාවයට ඔරොත්තු දෙන කෙටි කාලීන Bg 310 වී ප්‍රභේදය භාවිතා කරන්න.

- වී සඳහා ප්‍රමාණවත් ජලය නොමැති කුඹුරු ඉඩම් වල කුරක්කන්, මුං, කව්පි හා මෙනේරි වගා කිරීමට යොමු කිරීම.

- වාරි ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම සඳහා ඒකාන්තර තෙත් හා වියළි ක්‍රමය භාවිතා කරන්න. වගාව සංස්ථාපනය කර සති 3 කින් පමණ සෙ.මී. 5 පමණ උසට ජලය සම්පාදනය කරන්න. ඉන්පසු ජල සම්පාදනය නවතා පස් මට්ටමේ සිට සෙ.මී. 15 පමණ ගැඹුරට ජලය බැස යනතුරු සිට නැවත සෙ.මී. 5 උසට ජල සම්පාදනය කරන්න. මල් පිපීම ආරම්භය දක්වා මෙම ක්‍රමය භාවිතා කළ හැකිය.
- කාබනික පොහොර වැඩි වශයෙන් යොදා ගැනීම මගින් පසේ ව්‍යුහය දියුණු වී ජලය රඳා ගැනීමේ හැකියාව වැඩි වේ. ගොවිජන සේවා බල ප්‍රදේශ වලට වෙන් වෙන්ව නිර්දේශ කළ නව රසායනික පොහොර ප්‍රමාණයන් තෙතමනය සහිත අවස්ථාවේ දී පමණක් යෙදීම මගින් පොහොර වල කාර්යක්ෂමතාවය වැඩි වේ.
- ජලය හිඟවන විට හා උෂ්ණත්වය වැඩි වන විට පැළ මැක්කාගේ හානිය වඩාත් බරපතල විය හැකි නිසා බීජ ප්‍රතිකාරයක් ලෙස Imidachloprid (ඉමිඩක්ලොප්‍රිඩ්) හෝ Thiamethoxam (තයෝමෙතොක්සාම්) යොදන්න. පත්‍ර මයිටා පාලනය සඳහා සල්ෆර් හෝ මයිටා නාශකයක් යොදන්න. දුඹුරු පැළ කීඩෑවාගේ හානිය හා ගොයම් මකුණාගේ හානිය වැලැක්වීමට නිරන්තරයෙන් ක්ෂේත්‍රය පරීක්ෂා කර හානිය වැඩි වීමට පෙර නිර්දේශිත පළිබෝධනාශකයක් යොදන්න
- රෝග පාලනය සඳහා පිරිසිදු බිත්තර වී භාවිතය, නිර්දේශිත සමතුලිත පොහොර මිශ්‍රණය යොදා ගැනීම, වල් පැළෑටි පාලනය, ආසාදිත පිදුරු ක්ෂේත්‍රයට යෙදීමෙන් වැළකීම, කරකළ දහයියා පසට යෙදීම ආදී කාලෝචිත විසඳුම් යොදාගත යුතුයි.

- ස්වයං බිත්තර වී නිෂ්පාදන වැඩසටහනේ යෙදී සිටි ගොවීන් තමන්ගේ ක්ෂේත්‍ර වැඩි අවධානයකින් ආරක්ෂාකාරීව නඩත්තු කිරීම ඉතා වැදගත් වේ.
- නියං කාලයේදී ගොයම ඉක්මනින් පැසෙන බැවින් ඇද වැටීමට සහ බීජ හැළීමට පාත්‍ර වන නිසා ප්‍රමාද නොකර අස්වනු නෙළා ගන්න.

## අතිරේක ආහාර බෝග

- වර්ෂාපෝෂිත තත්ව යටතේ සාමාන්‍ය ගොඩ ඉඩම්ද, සුළු හා මහා වාරි මාර්ග වල හොඳින් ජලය බැසයන හා අර්ධ වශයෙන් ජලය වහනය වන ඉඩම් ද අතිරේක ආහාර බෝග සඳහා තෝරාගත යුතුයි. ජල වහනය දුර්වල ඉඩම් වී වගාව සඳහා ඉතිරි කල යුතුයි.
- වර්ෂාපෝෂිත තත්ව යටතේ ඉතා කෙටි කාලීන බෝග, වියලි කලාපය සඳහා **මුං ඇට** (MI-5, MI-6), **කව්පි** (MI-35 වරුණි, ANKCP1, MICP1) ද අතරමැදි කලාපයේ එකවර අස්වනු නෙලන බෝග සඳහා **කොල්ලු** (ANK Black, ANK Brown) හා **උඳු** ආදිය යොදා ගත යුතුයි.
- සුළු වාරි මාර්ග හා මහා වාරි මාර්ග වල හොඳින් ජලය බැස යන ඉඩම් සඳහා ඉහත ප්‍රභේද ඇතුළත්ව **රටකජු** (තිස්ස ) ද කුරක්කන් (රාවණා) අර්ධ වශයෙන් ජල වහනය වන ඉඩම් සඳහා **සෝයා බෝංචි** (MISB1, Pb1) ද යොදා ගත යුතුයි.

- ක්ෂේත්‍රයට ජලය සම්පාදනය බිංදු හෝ විසිරුම් යන ක්ෂුද්‍ර ජල සම්පාදනයන් මගින් කිරීම මෙම කාල සීමාව තුළ සුදුසු වන අතර තවද මද වැසි ඇති වුවුහොත් වැසි දිය රැස් කිරීම මඟින් වැසි ජලය ආරක්ෂා කර ගැනීම උචිත වේ. වල් මර්දනයේ දී සම්පූර්ණයෙන්ම වල් ගස් ඉවත් නොකර කප්පාදු කිරීම මඟින් වසුනක් සාදා ගත හැකි අතර එමගින් පොළොවෙන් ජලය වාෂ්ප (Evaporation) වීම අඩු වේ.
- අවම බිම් සැකසීම හා කාබනික ද්‍රව්‍ය හැකි පමණින් පසට එකතු කිරීම

## එළවළු හා පළතුරු

- මෙම නියං කාලය තුළ එළවළු හා පළතුරු හිඟය මග හරවා ගැනීම සඳහා ගෙවතු වගාවන් වැඩිදියුණු කල යුතුයි.
- ජල කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීම සඳහා Bucket kit (බාල්දි) හා Drum kit (බැරල්) යන බිංදු ජල සම්පාදන ක්‍රම යොදා ගැනීම සුදුසුයි.
- මුරුංගා, තුඹ කරවිල, තෝර පරිප්පු ,දඹල, අවර, පොකුරු දඹල හා නියං වැටකොළු වැනි නියං ප්‍රතිරෝධී ප්‍රබේද භාවිතය කළ යුතුයි.
- පස සංවර්ධනය කර ගැනීම සඳහා ආවරණ බෝග භාවිතය සුදුසු වේ. ඒ අනුව වියළි කළාපය, අතරමැදි කලාපය හා පහතරට තෙත් කලාපය සදහා රාබු, කංකුං, මුකුණුවැන්න, ගොටුකොළ, කුරතම්පලා, බතල ආදිය ද උඩරට තෙත් කලාපය සඳහා - රාබු, කැරට්, සලාද, බීට්, ගොටුකොළ, කංකුං ද යොදා ගත හැකිය.
- එළවළු වගාව සඳහා බිම් සකස් කිරීමේ දී පස් පෙරළීම නොකළ යුතුය. එමෙන්ම කාබනික ද්‍රව්‍ය වැඩි වශයෙන් පසට එකතු කළ යුතුයි.
- වසුන් යෙදීම ආවරණය වූ පරිසරයක වගා කිරීම, සාම්ප්‍රදායික පේළි ලෙස වගා කිරීමෙන් ඈත් වීම මඟින් ද ජල සම්පාදනය කරනු ලබන වේලාව, ජල සම්පාදන ක්‍රමය, වල් මර්දනය බෝග වල ජල අවශ්‍යතාවය උපරිම අවධිය හඳුනා ගැනීම, උචිත බෝග වර්ග තෝරා ගැනීම වැදගත්ය.
- බෝග සංකලනය (මිශ්‍ර බෝග) මඟින් භූමිය හා ජලය උපරිම ලෙස භාවිතා කිරීම
- එසේම නියඟය හමුවේ වගා කළ නොහැකි සුළු වශයෙන් හෝ තෙතමනය පවතින කුඹුරු ඉඩම් වල ජල අවශ්‍යතාවය අඩු බෝග (බණ්ඩක්කා, වම්බටු) වගා කළ යුතුයි.
- පළතුරු වගාවේදී අනිකුත් බෝග වලට අමතරව කෙසෙල්, පැපොල් හා අන්නාසි බෝග වල නිශ්පාදනය කෙරෙහි විශාල බලපෑමක් ඇතිවිය හැකිය.
- පළතුරු පැළ අවස්ථාවේදී දැල් ගෘහ තුළ රෝපණය කිරීම හා ජල සම්පාදනයේ දී බිංදු ජල සම්පාදනය මෙන්ම භූගත මැටි බඳුන් මඟින් ජල සම්පාදනය ද ක්ෂේත්‍රයේ ඇති පළතුරු ගස් වටා පස් යොදා බේසම් ක්‍රමයට පස සැකසීම මොරෙයියන් පාලනයේදී ඉවත්කරනු ලබන මොරෙයියන් ගස් අතර වසුනක් ලෙස දැමීම කල යුතුයි.
- කොළ එළවළු වගා කිරීම සඳහා හයිඩ්‍රොපොනික් වගා ක්‍රමය භාවිතා කිරීම සුදුසු වේ.

## පසු අස්වනු තාක්ෂණය

- නියං කාලය තුල අස්වනු නෙළිමේ ක්‍රමවේදය විධිමත් ආකාරයෙන් සිදුකළ යුතුයි. එළවළු හා පළතුරු අස්වනු නෙළීමේ දී දිනයේ උදේ කාලයේ දී ආරම්භ කර තද හිරු එළිය වැටීමත් සමඟම අවසන් කළ යුතුයි.
- ඇසුරුම්කරණයේ දී සුදුසු ඇසුරුම් ද්‍රව්‍යයක් භාවිතා කිරීම හා ගබඩාකරණයේ දී උෂ්ණත්වය පිළිබඳව මූලිකවම  සැළකිලිමත් වීම මගින් පසු අස්වනු හානි අවම කරගත යුතුයි.
- එළවළු හා පළතුරු පරිභෝජනයට අවශ්‍ය ප්‍රමාණයට මිල දී ගැනීමත්, ආහාර පිසීමේ දී ද අපතේ නොයවා භාවිතා  කිරීමත් ඉතා වැදගත් වේ.
- නිශ්පාදිත ආහාර කල් තබා ගැනීම ( පරිරක්ෂණය ) මගින් නියං කාලයේ දී ඇති වන ආහාර හිඟකම හා පෝෂණය යන ගැටළු අවම කර ගත හැකිය. ඒ සඳහා උදාහරණ ලෙස,
    - විජලනය කළ එළවළු හා පළතුරු බෝතල් කිරීම, චට්නි, අච්චාරු වර්ග සැකසීම, ශීතාගාර තත්වය යටතේ තබා ගැනීම,
    - මෙම කාලයේ දී අඹ හා කොස් අස්වැන්න බහුල බැවින් මෙම අස්වැන්න සංරක්ෂණ කිරීම සඳහා විවිධ ක්‍රමයන් භාවිතා කිරීම
    - දේශිය අල වර්ග වියළා තබා ගැනීම, බෝතල් කිරීම, පිටි නිෂ්පාදනය සැකසීම (බේකරි නිෂ්පාදන)
    - කොස් ඇට, අමු කොස් මදුලු, සිබිලි, රේණු ආදියෙන් කල් තබා ගත හැකි විවිධ නිෂ්පාදන සැකසීම
    - බිම්මල් වලින් චට්නි, මෝජු, සුප්, බයිට් වර්ග, පිටි, රසකාරක හා සොසේජස් ලෙස
    - ධාන්‍ය වර්ග වලින් පිට්ටු, ඉදිආප්ප, කැඳ වර්ග, රොටී ආදිය ද අමතර ආහාර ලෙස කේක්, පේස්ට්‍රි වර්ග, පුඩිං වර්ග  සැකසීම
    - මුං ඇට ආදිය ප්‍රරෝහණය කිරීමෙන් (මුල් ඇදීමට තබා) අනතුරුව ආහාරයට ගැනීම
    - විවිධ කොළ එළවළු වලින් සම්බෝල හා කොළ කැඳ මිශ්‍රණ ලෙස පිළියෙල කිරීම, සහල් සුළු ප්‍රමාණයක් ධාන්‍ය පිටි සමඟ මිශ්‍ර කර කැඳ වර්ග සෑදීම, පළතුරු කැබලි, ධාන්‍ය සහ වෙනත් ඇට මිශ්‍ර කර "බාර්"වැනි නිෂ්පාදන සෑදීම

## අල වර්ග

- ශ්‍රී ලංකාව තුළ විවිධ ප්‍රදේශ වල අර්තාපල්, කිරි අල, රාජා අල, ඉන්නල, දන්දින්නල, බතල, මඤ්ඤොක්කා ආදී අල වර්ග වගා කරනු ලබයි. ඉදිරියේ ඇති වන සහල් හිඟයට ආදේශකයක් ලෙස මේ අවස්ථාවේ දී අල වර්ග වගා කිරීම වඩාත් උචිත වේ
- පෙබරවාරි හා මාර්තු මාස වල දේශීය අල වර්ග වල අස්වනු නෙළීම නිසා මෙම කාලය තුළ අල වල සුලබතාවය වැඩිය. මෙම කාල සීමාව තුළ වැඩිපුර අල වර්ග වලට යොමු වීම වැදගත්ය.
- සාම්ප්‍රදායික ක්‍රම යොදා ගනිමින් වැඩිපුර ඇති අල වර්ග ගබඩා කර ගැනීම හා එයින් කොටසක් බීජ අල ලෙස සංරක්ෂණය කර වගා කිරීම වැදගත් වේ.

- මඤ්ඤොක්කා සහ බතල යන අල වර්ග දෙක වසරේ ඕනෑම කාලයක වගා කළ හැකි කෙටි කාලීන ප්‍රභේද සහිත බෝගයකි. එමෙන්ම මඤ්ඤොක්කා කොළ ද කොළ එළවළු ලෙස භාවිතයට ගත හැකි වේ.
- හාල් මල්ලෙන් බතල' වැඩසටහන මඟින් ගෙවතු සඳහා මලු තුළ බතල වගා කිරීම තවදුරටත් ප්‍රචලිත කිරීම සිදු කළ යුතුයි.

## බීජ සැපයුම සුරක්ෂිත කිරීම

නියං තත්ත්වයකින් පසුව එලඹෙන යල කන්නය බිත්තර බීජ හිඟ තත්ත්වයක් ඇතිවීමේ අවදානමක් පවතින බැවින් නියගයෙන් පසුව එලඹෙන සාමාන්‍ය කන්නයේ වගාව සඳහා බීජ සපයා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. එසේ නොවුනහොත් එම කන්නයෙහි ද බීජ හිඟවීම හේතුකොටගෙන වගා වපසරිය අඩුවීමෙන් රටේ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය අඩුවීමේ අවදානමක් ඇති වේ. මෙම තත්ත්වය වලක්වා ගැනීම සඳහා පහත විකල්ප ක්‍රියා මාර්ග ගත හැකි වේ.

- දැනට පවතින බීජ තොග සඳහා ප්‍රශස්ත තත්ත්වයන් ලබා දී සුරක්ෂිතව පවත්වා ගැනීමට කටයුතු කිරීම
- දැනට පවතින පාරිභෝගික නිෂ්පාදනයෙන් බීජ සඳහා සුදුසු කොටසක් තෝරා එම කොටස ඉදිරි අවශ්‍යතාවය සඳහා නඩත්තු කර පවත්වා ගැනීම
- පවතින සීමිත ජල ප්‍රමාණය භාවිතා කොට බීජ නිෂ්පාදන වගාවන් සිදු කිරීම හා එමඟින් හැකි උපරිම අස්වැන්නක් ලබා ගැනීම

වසර 40කට පමණ පසු ඇති වූ මෙම නියං තත්වය මඟහරවා ගැනීම සඳහා කාලෝචිත උපක්‍රම යොදා ගැනීම සඳහා ජනතාව දැනුවත් කළ යුතු වේ.

---

තාක්ෂණික සහාය : ආචාර්ය අමිතා බෙන්තොට (අධ්‍යක්ෂ-RRDI), ආචාර්ය බී.වී.ආර් පුන්‍යවර්ධන (නියෝජ්‍ය අධ්‍යක්ෂ - NRMC),
ජේ.ආර් සුදසිංහ (නියෝජ්‍ය අධ්‍යක්ෂ-Extension), ඩබ්.ආර්.ඩබ්.එම්.එස්.එන්.පී. වීරකෝන් ( සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ-Extension ), එම්.ඒ.පී.ඩබ්.කේ මලවිආරච්චි (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - FCRDI),
ආචාර්ය ඊ.ආර්.එස්.පී එදිරිමාන්න (නියෝජ්‍ය අධ්‍යක්ෂ-FRDI),
අනෝමා සෙනරත්න (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - FRU)

සැකසීම : අයි.එස්.එම්. හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ), කේ.එම් සිරිවර්ධන (තාක්ෂණික සහායක)

මග පෙන්වීම : ඩබ්.ඒ.පී. සිසිර කුමාර, අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන)